Diocese of Kurunagala

කුරුණෑගල දියෝකීසිය

குருநாகல் மறைமாவட்டம்

# Environment Policy

# පරිසර ප්‍රතිපත්තිය

# சுற்றுச்சூழல் கொள்கை

ප්‍රකාශන අයිතිය කුරුණෑගල දියෝකීසිය,

ලංකා සභාව

පිළිගැනීම් :

සම්පාදනය : වන්දනීය ජෝර්ජ් මෙල්ඩර් පියතුමා, වෛද්‍ය ලක්මිණි ඉලංගසිංහ, මහචාර්ය නේද්‍රා කරුණාරත්න, සෙනරත් යටවර මහතා, ඇන්ඩ්‍රියා ජෝන් මහත්මිය, කිංස්ලි ඇන්තනීදාසන් මහතා, රසික අබේසිංහ පියතුමා සහ කම්ටුවේ සාමාජිකයින්.

පරිවර්තන: ලක්දිනි පණ්ඩිතරත්න මහත්මිය, චන්ද්‍ර කුමාර් මහතා

**අභියෝජනය;** කුරුණෑගල දියෝකීසියේ පරිසර ප්‍රතිපත්තිය සභා සම්මත කිරීම

කෙසේද යත්;

ඇ) කුරුණෑගල රදගුරු පදවියේ පරිසර කමිටුව, පරිසරය පිළිබඳ ප්‍රතිපත්තියක් කෙටුම්පත් කර සකස් කර තිබීම;


ආ) කුරුණෑගල සහ අනුරාධපුරයේ ප්‍රාදේශික මට්ටමේ රැස්වීම් දෙකකදී සාකච්ඡා කර අනුමත කර, 2021 මැයි මාසයේ රට වසා දැමීමේදී මහනුවර ප්‍රාදේශික රැස්වීම කල්දැමීම හේතුවෙන්, ප්‍රතිපත්ති ලේඛනය සියලුම පූජකවරුන් වෙත විද්‍යුත් තැපෑලෙන් යවා අනුමත කර තිබීම;

ඇ) කුරුණෑගල දියෝකීසිය ස්ථාවර කාරක සභාව විසින් අනුමත කර තිබීම;
කුරුණෑගල දියෝකීසිය වාර්ෂික මන්ත්‍රණ සභා වාරයේදී කුරුණෑගල දියෝකීසියේ පරිසර ප්‍රතිපත්තිය සම්මත කර ගත යුතු බවට, කුරුණෑගල දියෝකීසිය වාර්ෂික මන්ත්‍රණ සභා නියෝජිතයන් වන අපි යෝජනා කරමු.

යෝජනා කළේ: මහාචාර්ය නේද්‍රා කරුණාරත්න මහත්මිය
ස්ථිර කළේ: එස්. යටවර මහතා



යෝජනා කළේ : මහාචාර්ය ඩී. එන්. කරුණාරත්න / ලේකම් දියෝකීසියේ පරිසර කමිටුව



ස්ථිර කළේ : සභා සාමාජික සෙනරත් යටවර / සභා සාමාජික

## කුරුණෑගල රදගුරුතුමා සහ ලංකා සභාවේ සභාපති රදගුරුතුමාගේ පණිවිඩය

"ස්වාමීනි ශුද්ධ තැනැත්තන්ගේ සභාව තුළ ඔබගේ විශ්වාසවන්තකමට ස්වර්ගය ප්‍රසංශා කරයි. අහස ඔබේය. පොළොවද ඔබේය: ලෝකය සහ එහි ඇති සියල්ල - ඔබ ඒවා පිහිටුවා ඇත. "

ගීතාවලිය 89.5, 11

දෙවියන් වහන්සේගේ යහපත් මැවිල්ලේ භාරකාර සහෝදර සහ සහෝදරියනි

"පරිසරයට අප අවශ්‍ය නැත, අපට පරිසරය අවශ්‍යයි" යන ප්‍රකාශය අපි අසා ඇත්තෙමු. පරිසරයට තර්ජනයක් වන මෑතකාලීන මිනිසුන් විසින් නිර්මාණය කරන ලද ව්‍යසනයන් දකින විට සහ අසන විට එහි ප්‍රතිවිපාක අත්විඳින විට, වෙන කවරදාටත් වඩා මෙම ප්‍රකාශය අප සැමට අදාළ වේ,

අපගේ ඇදහිල්ලට අනුව, මෙම අපූරු පරිසරය රැකබලා ගැනීම භාරව සිටින මිනිස්සුන්ට ඔවුන්ගේ භූමිකාවන් අමතක වී ඇත; සංවර්ධනය හා සම්පත් සූරු කෑම පසුපස හඹා ගියේය. මෙය අපට අමතක කළ නොහැකි, කල් තබා හෝ ඉවත දැමිය නොහැකි එක් සත්‍යයකි. සභාවක් වශයෙන් ජාතීන් හා පුද්ගලයන් වශයෙන් පව් කර ඇති බව වටහා ගත යුතුය.

දෙවියන් වහන්සේගේ මැවිල්ලේ සංරක්ෂණය සහ තිරසාරත්වය සඳහා භාරකාරත්වයේ සහ ක්‍රියා කිරීමේ මෙම භූමිකාව අවබෝධ කර ගැනීමට අප දැන් ක්‍රියා කළ යුතුය. මැවිල්ලේ අඛණ්ඩතාවය ආරක්ෂා කිරීමටත්, පෘථිවියේ ජීවය පවත්වා ගෙන යාමටත් , අලුත් කිරීමටත් වෙර දරන ඇංග්ලිකානු සභාවේ මෙහෙවරේ පස්වන සලකුණ අවබෝධ කර ගනිමින්, ස්වාභාවධර්මයේ අසිරිය තුළ පිහිටුවා ගත් මෙම අභිප්‍රාය, ප්‍රතිපත්ති සඳහා දියෝකීසියක් ලෙස අපි, අපේ දේවස්ථාන පළාත් සමඟ කැප වෙමු.

දියෝකීසියේ පරිසර කමිටුවේ කැපවීම ඇතිව, දෙවියන් වහන්සේගේ මැවිල්ල සඳහා සත්කාර කිරීමේ දේවසේවය සංසරණය, පරාවර්තනය ක්‍රියාවට නැංවීම සහ ඉදිරියට ගෙන යාම සඳහා අප ඔබට දියෝකීසියේ 'පරිසර ප්‍රතිපත්තිය' ඉදිරිපත් කරමු.

## ඇමුණුම 2 - දේවස්ථාන කණ්ඩායම් වල ක්‍රියාකාරකම්

| | |
|---|---|
| දේවස්ථානය | 〉 දෙවිඳුන්ගේ මැවිල්ල අගය කරන විශේෂ දේව මෙහෙයක් පරිසර ඉරුදින (ජුනි මාසයේ 1 වන සතියේ) සමරන්න.<br>〉 තරුණ සංගම් හා දරුවන් ඇතුළත් ක්‍රියාකාරී පරිසර කමිටු සෑම දේවස්ථානයකම සංවිධානය කරන්න.<br>〉 තමාගේ දේවස්ථාන පරිසර හිතකාමී ලෙස හඳුන්වා දෙමින් එහි සෑම ක්‍රියාකාරකමක්ම පරිසර හිතකාමී දිරාපත්වන ද්‍රව්‍ය භාවිතයෙන් සැලසුම් කිරීම, පොලිතීන් ප්ලාස්ටික් වැනි ද්‍රව්‍ය බැහැර කිරීම.<br>〉 යම්කිසි සභාවක අඩු ආදායම්ලාභී සභිකයන් සිටී නම් ස්වයං රැකියාවට හුරු කිරීම් සඳහා කාන්තා සමිති තුළින් රෙදි විවීම, වේවැල් විවීම කඩදාසි බෑග්, රෙදි බෑග් සෑදීම, හණ කර්මාන්තය හා මැටි කර්මාන්තයට යොමු කල හැක.<br>〉 දේවස්ථාන සැරසිලි වල} පොලිතින් භාවිතයෙන් බැහැර වී අනෙකුත් ස්වභාවික දිරන ද්‍රව්‍ය පාවිච්චි කරන්න.<br>〉 තල් අතු ඉරිදා කුරුස සෑදීමේ දී ගොක් කොළ වෙනුවට පොල් කොළ හෝ වෙනත් කොළ භාවිතා කරන්න. (ගොක් අතු සහ පොල් මල්, පුවක් මල් කැපීමෙන් ගසේ අස්වැන්න අවුරුදු 3 කට බාල වේ)<br>〉 දැනට තිබෙන බලශක්ති ක්‍රම වෙනුවට විදුලිය ජනනය සඳහා පරිසර හිතකාමී සූර්ය බලශක්තිය යොදාගන්න.<br>〉 විදුලි බිල අධික ආයතන වලට මෙය ඉතා සුදුසුම ක්‍රමයකි. |
| පූජක නිල නිවාස | 〉 ගෙවතු සහිත ප්‍රසන්න නිල නිවාස පවත්වා ගැනීමට උනන්දු කරවන්න.<br>〉 පූජක නිල නිවාස වල අවට ගෙවත්තෙන් ආදායම් වැඩි කිරීමට උනන්දු කරවන්න.<br>උදා :- පොල්, පළතුරු, කුළුබඩු බෝග එළවළු සහ මල් |
| පූජක හා දියාකොන් | 〉 පරිසර හිතකාමී පිළිවෙත් පිළිබඳව නිතර සභිකයන් දැනුවත් කිරීම හා ඉගැන්වීම.<br>〉 දේවිඳුන්ගේ මැවිල්ලේ භාරකරුවන් ලෙස ආත්මික වර්ධනය ඇති කරගැනීම. |
| දේවස්ථාන කණ්ඩායම්, පරිසර කමිටු, සබත් පාසැල්, තරුණ සමිති, කාන්තා සමිති සහ අනෙකුත් | 〉 දේවස්ථාන භූමියේ පරිසරය ආරක්ෂා කි; ම හා රැකබලාගැනීම.<br>〉 ධනාත්මක සිතුවිලි තුලින් පරිසර හිතකාමී ක්‍රම හා විධි භාවිත<br>කරන වගකීම් දරන සභිකයන් වීම.<br>〉 අවට පරිසරය සුන්දරත්වයෙන් තබාගැනීමට මල් වැවීමෙන් පරිසරය අලංකාර කිරීම සහ ආදායම් ලබන බෝග වැවිය හැකිය.<br>〉 දේවස්ථානයේ විශේෂ දවසක් වෙනුවෙන් පැළයක් සිටුවා අනාගතය වෙනුවෙන් ගස නම් කරන්න. (උද්භිද නාමය, දිනය ඇතුළුව) |



ප්‍රාදේශික මට්ටමින් සාකච්ඡා කර, සමාලෝචන සහිතව සම්පාදනය කර ඇති මෙම ප්‍රතිපත්තිය, 2021 ඔක්තෝම්බර් 30 වැනි දින පැවති දියෝකීසි මන්ත්‍රණ සභාවේ යෝජනා කරන ලද, අතර ඒකමතිකව පිළිගෙන, භාරකාරත්වය සඳහා වන අපගේ කැපවීම සහ අපගේ සියලුම මීසම් තුළ මෙහෙවර කටයුතු සඳහා මාර්ගෝපදේශයක් ලෙසට අපි මෙයින් කැමැත්ත පළ කර අවසර දෙමු.

අපගේ මැවුම්කාර , පෝෂක හා ශුද්ධවන්ත දෙවියන් වහන්සේගේ සාමය අපව මෙහෙයවීම සහ බලගැන්වීම, අප මැවීමේ අඛණ්ඩතාව සුව කිරීමේ සහ ප්‍රතිෂ්ඨාපනය කිරීමේ දෙවියන්ගේ උපකරණ බවට පත් වේවා !

**අතිගරු කීර්තිසිරි ප්‍රනාන්දු රදගුරු තුමා**<br>
**කුරුණෑගල දියෝකීසිය**<br>
**2021 ශුද්ධ වූ අන්දා තුමාගේ මංගල්‍ය දින**

## කුරුණෑගල දියෝකීසියේ අනුනායකතුමාගේ පණිවිඩය

"සමිඳුනි ඔබේ කර්මාන්ත කොතරම් විවිධාකාරද? ඔබ සියල්ල ප්‍රඥාවෙන් මැවූ සේක. පොළොව ඔබ මැවූ සතුන්ගෙන් පිරී ඇත."
ගීතාවලිය 104: 24

කිතුණු අප ශුද්ධ මැවිල්ලේ අග්‍ර ඵලය ලෙස සළකනු ලබයි. දේව ස්වරූපය දරමින් මැවිල්ලේ භාරකාරත්වය, සහ එහි වගකීම අප වෙත දෙවි සමිඳුන් පවරා දි ඇති බව අප ශුද්ධ බයිබලයෙන් උගනිමු. මෙම භාරකාරත්වය විශාල වගකීමක් හා ගෞරවයක් මනුෂ්‍යයාට ගෙන දුන්නද ඔහු එය නිවැරදිව අවබෝධ කරගත් බවක් මැවිල්ලේ ඇරඹුමේ පටන්ම අපට පසක් වේ. එබැවින් මැවිල්ල පිළිබඳව අපට ලැබී ඇති වගකීම භාරකාරත්වයක් පමණක්ද නැතහොත් වගකිව යුතු පරිසරය වැඩිදියුණු කොට සංරක්ෂණය කරන්නාවූ ගබඩාකාරත්වයක් දැයි අප ගැඹුරින් විග්‍රහ කරගත යුතුවෙමු.


දේව මැවිල්ල රැක ගැනිම වෙන කවරදාටත් වඩා අපට පැවරී ඇති අත්‍යවශ්‍ය හා දැඩි අවධානයක් දිය යුතු වේ. ලෝකයේ දක්ෂිණ හා උත්තර ධ්‍රැවයේ සාගර හා ග්ලැසියර දියවිම, මුහුදු ජලය උෂ්ණත්වය ඉහළ යෑම, සතුන් වඳ විම, හා විනාශ විම පිළිබඳ මාධ්‍යය ඔස්සේ නිතර ශ්‍රවණය කරන්නෙමු. මේ සඳහා ප්‍රබල ලෙස හඬ නැංවූ ග්‍රීක ඔතඩොක්ස් සභාවේ ආදි පීතෘ වන1 වන බර්තෝලමියුස් හා ශු. ප්‍රැන්සිස් පාප්වහන්සේ ගේ මෙහෙවර අසීමිත ලෙස අගය කළයුතු වෙමු (පරිසරය සඳහාවූ විශ්ව ප්‍රකාශය එළිදැක්වීම). විශ්ව ඇංග්ලිකානු හඬ තම මෙහෙවරේ ප්‍රධාන අංශ 5න් එකක් ලෙස පරිසරය සුරැකීම හා ප්‍රවර්ධනය කිරිම හඳුනාගෙන ඇති අතර, 2010 පැවැති ලැම්බත් සමුළුවේදි එම අවශ්‍යතාවය හඳුනාගෙන පරිසරය සඳහාවූ අපගේ කැපවීම හා නව දැක්ම යුතුකමක් ලෙස සළකා ඉටුකිරීමට අපට ඇරයුම් කරයි.

කුරුණෑගල ලංකා සභා රදගුරු පදවිය පසුගිය 70 වසර කාලය පුරා පරිසර හිතකාමි මෙහෙවරකට දායකත්වය දැක්වීමේ අරගලයක් ඇතුව ක්‍රියා කල අතර, එය වඩාත් තහවුරු කොට ක්‍රමාණුකූල ලෙස ප්‍රතිපත්තියක් බවට පත් කර ගැනීමට 2021 වසරේදි හැකිවිම විශේෂ ජයග්‍රහණයකි. මේ මගින් බලන කල ලොකයේ බොහෝ ධනවත් රටවල දියෝකීසිවලට වඩා



## පරිපාලන නිලධාරින් හා අනෙකුත් පාර්ශවකරුවන්

ඇමුණුම 1



3. තමාගේ සේවා කාලය තුළ සිටින නිවාස හා ඒ අවට පරිසරය උනන්දුවෙන් රැකබලා ගැනීම සහ වගා කර වැඩිදියුණු කිරීම.

**මුලපිරීම**

- පළතුරු එළවලු වැනි ප්‍රයෝජනවත් කෘෂි බෝග වගා කිරීමට උනන්දු වන්න.
- තම නිවසේ අලංකාරත්වය රැකගැනීමට මල් වගා කරන්න.
- පූජක නිල නිවාස හා නිවාසය තුළ සිටින කාලය සුන්දර නිවසක් ලෙස හැඟීම ඇති කිරීමට සැලැස්සීම.
- ශබ්ද දූෂණයෙන් අවට නිවාස වලට සිදුවන හිරිහැරය වැළැක්වීම.
- දේවස්ථාන කාර්ය සභිකයින් හා පරිසර කමිටු සාමාජිකයන් සඳහා පරිසර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

**උපාය මාර්ග 5 d**

සභිකයන් සඳහා අත්කම් හා ගෙවතු වගා වැඩසටහන් පැවැත්වීම.

**අභියෝග**

- ස්වයං රැකියා ව්‍යාපෘති ලෙස අත්කම් ඉගැන්වීම.
- ගෙවතු වගාව ආදායම් ජනනය කරන මාර්ගයක් බවට පත්කිරීම.
- බීජ පොළොවට අයිති බැවින් බීජ පොළොවට ලබාදෙන්න.

**මුලපිරීම**

1. නිවසක් තැනීමේ දී පරිසර හිතකාමී ද්‍රව්‍ය යොදාගන්න.
   උදා :- සිමෙන්ති වෙනුවට ගඩොල් යෙදීම.
2. අත්කම් නිර්මාණ වලට ස්වභාවික අමුද්‍රව්‍ය භාවිතා කරන්න.
   උදා :- කඩදාසි, වේවැල්, ලී භාණ්ඩ හා කොහු
3. දරුවන් ගෙවතු වගා වැඩසටහන් වලට සහභාගි කරවා ගෙවතු වගාවට හුරු කරවීම.
4. ජලය රැස්කිරීමට ගුරුලේත්තු හා ඉවීමට මැටි භාණ්ඩ භාවිතා කිරීම.
5. දේවස්ථාන සහ නිවාස පරිසර හිතකාමී ආයතන ලෙස පවත්වා ගැනීම.



අප දර්ශනය තුල ඉදිරියෙන් සිටින අතර පහළ මට්ටමේ ජනතාවගේ පටන් රදගුරු තුමන්ලා දකින මෙම ප්‍රඥප්තිය අධ්‍යයනය කොට සාකච්ඡාවට ලක්කොට සම්පාදනය කිරීමට හැකිවීම අතිශය විජයග්‍රහණයකි.

වර්ෂ 2021 ඔක්තෝබර් මස 30 වන දින පැවති අපගේ 65 වන දියෝකීසි මන්ත්‍රණ සභාවේදි බහුතර කැමැත්තක් මෙය සමඟ වූ අතර මෙවැනි ගැඹුරු ප්‍රඥප්තියක් ගොඩ නැගීමට උර දුන් අප දියෝකීසියේ අතිගරු කීර්තිසිරි ප්‍රනාන්දු රදගුරු හිමිපාණන් හා පරිසර කමිටුවේ සෑම සාමාජික සාමාජිකාවකටම අපගේ හෘදයංගම කෘතඥතාව පලකර සිටිමු. කාණ්ඩායම් හැඟීමෙන් යුතුව අප දියෝකීසියේ සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි දේවස්ථාන භූමි හා වෙනත් ව්‍යාපාර තුලින් ඵලදායක උයන් ලෙස භාවිතා කිරීමට හා පරිසරයට හිතකාමී ලෙස එය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ඇරඹි සංවාද හා විවිධ වැඩසටහන් වල අවසාන ප්‍රතිපල වූයේ විශේෂිතවූ ප්‍රඥප්තියක් නිර්මාණය වීමය.

ප්‍රඥප්තියක් තිබූ පමණින් අපගේ පරිසරය ක්‍රමවත් වේද? යන්න පිළිබඳව ප්‍රායෝගිකව අධ්‍යයනය කොට එමගින් නවීන ලෝකයට ගලපාගත හැකි ප්‍රායෝගික වැඩ පිළිවෙලකට අපට මෙමගින් මඟපෙන්වා ඇති අතර ඉදිරි පියවරෙදි පළාත් පරිසර කමිටු පිහිටුවීම දේවස්ථාන භූමි අලංකරණය හා ආදායම් ලැබිය හැකි ආකාරයට සංවර්ධනය කිරීම තුලින් ඵල ලැබිමට අප අපේක්ෂා කරමු.

මෙම ක්‍රියාකාරීත්වය ශුද්ධ වචනයේ පරිසරය පිළිබද දේව අභිමානත්වයන් ඉටු කිරීමට ගන්නා ලද සුළු උත්සහයක් වන අතර අපගේ දියෝකීසියේ සියලු ආයතනවල මෙය ක්‍රියාත්මක කිරීම මෙන්ම නූතන පරම්පරාව පරිසරය සුරැකීමටත් එය සංරක්ෂණය කිරීමටත් පෙළඹවීමට හැකිවනු ඇත.

'' භාරකාරත්වය'' යන වගකීම වැරදි ලෙස අර්ථකථනය කරගනිමින් අප යන සම්ප්‍රදායක ගමන නතර කර දමා පරිසර හිතවාදි සංවර්ධන ක්‍රියා මාර්ග වලට යොමුවීම වර්තමානයේ අපට ඇති අභියෝගයයි. එය අනාගත පරපුරට සුරැකිව භාරදීම අප එකිනෙකාගේ වගකීමයි.

**වන්දනීය ජෝර්ජ් මෙල්ඩර් පියතුමා**
**අනුනායකතුමා කුරුණෑගල දියෝකීසිය**

# පරිසර ප්‍රතිපත්තිය


| පටුන | පිටු අංකය |
|---|---|
| කාණ්ඩය **A** - විධායක සාරාංශය | 7 |
| I. පූර්විකාව | 8 |
| II. ප්‍රතිපත්ති සංවර්ධනය | 8 |
| III. ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම | 8 |
| IV. ප්‍රතිපත්ති අරමුණු හා උපාය මාර්ග | 8 |
| කාණ්ඩය **B** - දියෝකීසි පරිසර ප්‍රතිපත්තිය අරමුණු, උපායමාර්ග, අභියෝග හා මුලපිරීම | 11 |
| පරිසර ප්‍රතිපත්ති අරමුණ 1 | 12 |
| පරිසර ප්‍රතිපත්ති අරමුණ 2 | 13 |
| පරිසර ප්‍රතිපත්ති අරමුණ 3 | 14 |
| පරිසර ප්‍රතිපත්ති අරමුණ 4 | 17 |
| පරිසර ප්‍රතිපත්ති අරමුණ 5 | 18 |
| ඇමුණුම 1 | 21 |
| ඇමුණුම 2 | 22 |




**අරමුණු 5 b**

පරිසර අධ්‍යාපන වැඩසටහන් පාසැල් සහ සබත් පාසැල් වල ක්‍රියාත්මක කිරීම.

**අභියෝග**

- පූජක පක්ෂයට පරිසරය පිළිබඳ අධ්‍යාපනය ලබාදීම තුළින් පරිසරය සමග සහයෝගයෙන් සිටීම පිළිබඳ දැනුවත් කිරීම.
- පාසැල් හා සබත් පාසැල් වල දරුවන්ට පරිසරය විඳීමට සහ අගය කිරීමට ඉගැන්වීම.
- පරිසර හිතකාමී ද්‍රව්‍ය භාවිතය පිළිබඳව සැමවිටම දරුවන්ව දැනුවත් කරන්න. උදා :- පොලිතින් වලින් එතූ කෑම වෙනුවට කෑම පෙට්ටියක් භාවිත කිරීම.
- ප්ලාස්ටික් භාවිතයෙන් ඉවත් කිරීම. ඒ වෙනුවට පරිසර හිතකාමී දේ භාවිතා කිරීම.

**මුලපිරීම**

1. පරිසරය සම්බන්ධ දැනුවත් වීමේ වැඩසටහන් හා වැඩමුළු පැවැත්වීමට පහත සඳහන් රාජ්‍ය නිලධාරින් පාවිච්චි කරන්න. (ග්‍රාමසේවක, ආර්ථික සංවර්ධන නිලධාරි, පාසැල් ගුරුවරු, කෘෂි හා වන දෙපාර්තමේන්තු නිලධාරීන්)
2. ස්වභාව සෞන්දර්ය ඇගයීම සඳහා චාරිකා සංවිධානය තුළින් පරිසරය විඳීමට හා අගය කිරීමට සැළැස්වීම.
3. ශිෂ්‍යයන් තුළ පරිසරය පිළිබඳ ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීමේ ඉලක්ක මෙන්ම ප්‍රතිචක්‍රීකරණය හා කසළ කළමනාකරණය පිළිබඳව ව්‍යාපෘති නිවස තුළ සිට ආරම්භ කිරීමට දරුවන්ට සලස්වන්න.
4. දරුවන්ගේ ආත්මික වර්ධනය වැඩි කිරීමට දෙවිඳුන්ගේ මැවිල්ලේ විශ්මිත බව නිතර දරුවන් තුළට කාවැද්දීම.

**උපාය මාර්ග 5 C**

දේවස්ථාන, පූජක නිල නිවාස, පාසැල් හා අනෙකුත් ආයතන වල පරිසර පද්ධති රැකබලා ගැනීම.

**අරමුණු 5 C**

1. ගෙවතු වගා වැඩසටහන් පැවැත්වීම.
2. අවට පරිසරයේ ඇති අලංකාරත්වය හා පිරිසිදුකම රැකගැනීම.

**මුලපිරීම**

1. ගස් නොකපන්න. සුදුසු කාලයේ දී කප්පාදු කිරීමෙන් දිගු කලක් ඒවා සංරක්ෂණය වේ.
2. නිතරම කුරුල්ලන් හා සතුන් ගැවසෙන ප්‍රදේශ සංරක්‍ෂණය කිරීම.
3. වඳවී යන ශාක හා දුර්ලබ ශාක සංරක්‍ෂණය කිරීම.
4. වාණිජ කටයුතු සඳහා එමෙන්ම මානුෂික අවශ්‍යතා සඳහා ද කැළෑ එළි කිරීමෙන් වැළකීම.
5. බීජ වනාහි පොළොවට අයත් මැවිල්ලකි. ඒවා කසළ භාජන වලට නොදමන්න. පසට විසි කරන්න.

**අරමුණු 5**

පරිසරය අගය කිරීමේ වැඩසටහන් මෙහෙය වීම.

**උපාය මාර්ග 5 a**

පරිසර දිනය දෙවිඳුන්ට ස්තූති දීමේ නමස්කාර මෙහෙයක් ලෙසින් පවත්වන්න.

**අභියෝග**

- ස්වභාව සෞන්දර්යෙන් පිරි මේ රම්‍ය දිවයින ගැන දෙවිඳුන්ට ස්තූති ප්‍රශංසා කිරීම.
- හිතකාමී නිරෝගී පරිසරයකින් ලැබෙන ප්‍රතිලාභ ගැන සභාවේ අයට දැනුම ලබාදීම.
- ක්‍ෂේත්‍ර වැඩසටහන්, සෞන්දර්යාත්මක චාරිකාවන් ප්‍රායෝගික වැඩසටහන් මගින් දිනපතා අපට ලැබෙන හිරු එළිය, පිරිසිදු වාතය, පානීය ජලය සහ අනෙකුත් අප්‍රමාණ ආශිර්වාද ගැන අගය කිරීමට සැලැස්වීම.
- උදාහරණයක් ලෙස තරුණ සංගමය හා දරුවන් පරිසරය හා සම්බන්ධ ප්‍රයෝගික ක්‍රියාකාරකම් සඳහා යොමු කිරීම.

**මුල පිරීම.**

1. ජූනි මාසයේ පළවෙනි සතිය තුල සියලුම දේවස්ථාන වල පරිසර ඉරුදින සැමරීම.
2. සෑම ඉරිදාවකම මැදහත් යාඥාවට පරිසරය පිළිබඳ කෙටි වාක්‍යයක එකතු කරන්න.
3. පරිසරයේ ගුණධර්ම හා වටිනාකම් විනාඩි 5 ක් සබත් පාසැලේ දි සාකච්ඡා කරන්න.
4. දේවස්ථානය, ආයතනය, නිවසේදි (උදාහරණ බව්තීස්මය ස්ථිර වීම හා උපන්දින වැනි) විශේෂ දින වලදි සිහිවීම පිණිස පැළයක් සිටුවන්න. දරුවන්ට එය විශේෂ පැළයක් ලෙස රැකබලාගැනීමට උගැන්වීම.



# කාණ්ඩය A

## විධායක සාරාංශය

### පූර්විකාව ප්‍රතිපත්ති සංවර්ධනය, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, ප්‍රතිපත්ති අරමුණු හා උපාය මාර්ග

## I. පූර්විකාව

දෙවිඳුන්ගේ මැවිල්ල සහ එහි විස්මිත බව බයිබලයේ උත්පත්ති කථාවේ සිට අලුත් ගිවිසුම දක්වා මැනවින් විදහා දක්වයි. එහි ඇති සමතුලිත බව අපට සාක්ෂි විදහාපායි. මෙම මැවිල්ලේ භාරකරුවන් ලෙස මිනිස් සමාජය වන අපට භාරදී එය රැකබලා ගැනීමේ වගකීම ආරක්ෂා කිරීම සහ පෝෂණය කිරීම පිළිබඳ කිතුනු සමාජය දැනුවත් කිරීම වර්තමානයට අත්‍යවශ්‍ය කරුණක් බව නොරහසකි.

## II. ප්‍රතිපත්ති සංවර්ධනය

කුරුණෑගල දියෝකීසියේ පරිසර කමිටුව වසර 20 කට වඩා අධික කාලයක් අප දේවස්ථාන කිතුනු ප්‍රජාව විවිධ ආකාරයෙන් දැනුවත් කිරීමේ කාර්යයේ යෙදී සිටියි. මෙම පරිසර ප්‍රතිපත්තිය වනාහි ඒ නිපුනතාවය හා අත්දැකීම් තුලින් සැලසුම් කරන ලද්දකි. මෙයින් ඉලක්ක කර යොමු කරනුයේ විවිධ ක්ෂේත්‍ර තුල පරිසර හිතකාමී පිළිවෙත් සඳහා කිතුනු ප්‍රජාව ක්‍රියාත්මක විය යුතු ආකාරයත්ය. පරිසර ප්‍රතිපත්ති සංවර්ධනය වීමට නම් පරිසර ගැටලු පිළිබඳ ප්‍රජාව මනාව දැනුවත් වීම අත්‍යවශ්‍ය බව හැගේ.

## III. ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

පරිසර ප්‍රතිපත්තිය සඳහා ක්‍රියාත්මක වීමට පාදක වනුයේ පරිසරයට අදාළ ක්ෂේත්‍ර යයි. ක්‍රියාත්මක වීම සිදු කරනුයේ අරමුණු හා උපාය මාර්ගයන් තුළින්ය. කුරුණෑගල දියෝකීසියේ රදගුරු තුමන් සහ ස්ථාවර කමිටුවත් (කාරක සභා) පරිසර කමිටුවත් මෙම පරිසර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරවීමට බැඳි සිටියි. සෑම සභාවකම පූජකතුමන්, දහම් සේවක සේවිකාවන් දේවස්ථාන සභිකයන් මගින් කරන වැඩසටහන් වල සම්බන්ධීකරණය හා එහි අධීක්ෂණය සම්බන්ධයෙන් ස්ථාවර කාරක සභාව වගකීම දරයි. ඇමුණුම 1 න් පුද්ගලයින්/සංවිධාන/කණ්ඩායම්, අරමුණු හා උපාය මාර්ග පිළිබඳව දක්වා ඇත.

## IV. ප්‍රතිපත්ති අරමුණු හා උපාය මාර්ග



### අරමුණු 4

පරිසර පද්ධතිය ජෛව පද්ධතිය සහ විශේෂිත සත්ව භාණ්ඩ සංරක්ෂණය.

### උපාය මාර්ග 4 a

උපාය මාර්ගිකව මිනිස් හා සත්ව ගැටුම් අවම කරන්න.

**අභියෝග**

- සතුන්ට ගම්වැදීමට සිදුවන අවස්ථා වැළැක්වීම.
- සතුන් දඩයම් කිරීම නැවැත්වීම.
- සතුන් හා පක්ෂීන් සතු ඉඩ අනවසරයෙන් අල්ලා ගැනීම නැවැත්වීම.

**මුලපිරීම**

1. සතුන් ඇද ගැනීමේ ආකර්ෂණීය දේවල් වලින් වැළකී නිසි කසළ කළමනාකරණය පිළිබඳ අධ්‍යනයකට ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කරන්න.
2. වනසතුන් ආරක්ෂා කිරීම අවශ්‍ය බව හා ඔවුන්ගේ වටිනාකම පිළිබඳ උගන්වන්න.

### උපාය මාර්ග 4 b

ස්වභාවික ජීවන රටා විනාශ කිරිමෙන් වැළකී ශාක හා සත්ව ජීවිත සඳහා අවකාශයක් ඉතුරු කිරීමට සහතික වන්න.

**අභියෝග**

- වනාන්තර වනාහි රක්ෂිතයන්ය. අනාගත පරපුර වෙනුවෙන් ඒවා ආරක්ෂා කරන්න.
- වාණිජ කටයුතු සඳහා ගස් කැපීමෙන් වැළකී සතුන්ගේ ස්වභාවික වාසස්ථාන එලෙසම තබන්න.
- ජෛව විවිධත්වය රැකගැනීම සඳහා පරිසර පද්ධතිය විනාශ නොකර එලෙසම පවත්වාගෙන යාම.
- ගස් වනාහි සතුන් සහ කුරුල්ලන්ගේ නිවාස වේ.
- සැම බීජයක්ම පොළොවට විසි කරන්න.

3. පස සාරවත් කිරීමට සත්ව අපද්‍රව්‍ය වන ගොම, කුකුල් අපද්‍රව්‍ය යොදාගැනීම.
4. සශ්‍රික පස, පැළ සඳහා පමණක් භාවිතා කරන්න. ඉදිකිරීම් සඳහා භාවිතා නොකරන්න. නිසරු පස ඉදිකිරීම් වලට යොදා ගන්න.
5. ඉවතලන සැකසූ ආහාර හෝ වෙළඳපොලෙන් ලබාගත් වැඩිපුර ආහාර වලින් වැඩිපුර කසළ ඇතිවීම වලක්වා ගන්න. පමණට සෑහෙන දෙයට පුරුදු වන්න.

**උපාය මාර්ග 3 C**

ස්වභාවික වටාපිටාවේ අලංකරණය, සංරක්ෂණය

**අභියෝග**

- අපද්‍රව්‍ය දැමීම් හා විසිකිරීම නිසා කරන පරිසර දූෂණයෙන් වළකින්න.
- වනාන්තර අනවසරයෙන් අල්ලා ගැනීමෙන් වළකින්න.
- ස්වභාවික පරිසරය විනාශ නොකර එලෙසම රැකගන්න. එහි වෙසෙන සතුන් හා කුරුල්ලන්ට එම පරිසරය ඉතිරි කරන්න. මේ ගැන සිතා ක්‍රියා කරන්න. මෙය ඔවුන්ගේ ජන්ම භූමිය බව සිහි තබාගන්න.
- මව් පැළ ජාන තාක්ෂණයෙන් අරාක්ෂා කරන්න.

**මුලපිරීම**

1. ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන් සංවිධානය කරන්න. නොදිරන ද්‍රව්‍ය අවම කරන්න. නැවත භාවිතා කරන්න. ප්‍රතිචක්‍රීකරණය කරන්න.
2. කසළ වෙන්කර එකතු කිරීම සඳහා වෙනම බඳුන් සපයන්න.

   උදා :ප්ලාස්ටික්, කඩදාසි, ඉවතලන ආහාර
3. සමනලුන් මීමැස්සන් සහ කුරුල්ලන් ආකර්ෂණය කරන මල් පිපෙන ශාක සහ පැළෑටි සිටුවන්න.
4. මල් වැඩිපුර පිපෙන්නට සැලැස්වීම සඳහා පැළෑටි වලට රසායනික දියර ඉසීමෙන් වළකින්න. පරාගනයට හිතකර කෘමින් එමගින් විනාශ වේ
5. ස්වභාවික මව් ශාක විනාශ කරන ක්‍රමවේදයක් වු ජාන තාක්ෂණය භාවිතයෙන් වැඩිදියුණු කල බීජ භාවිතයෙන් වළකින්න.



**ප්‍රතිපත්ති අරමුණු 1**

ජනතාවගේ නිරෝගි පැවැත්ම සඳහා වායුගෝලය ඇති වාතයේ පිරිසිදුකම රදා පවත්වා ගැනීම වෙනුවෙන් සහතික වීම.

**උපාය මාර්ග**

a) වාතයේ පිරිසිදුකම රැකගැනීම සඳහා ගස් වැවීම.

b) සූර්ය බල ශක්තිය භාවිතයෙන් අහිතකර වායු පරිසරයට මුදාහැරීම පාලනය කිරීම.

**ප්‍රතිපත්ති අරමුණු - 2**

නිරන්තරයෙන් පිරිසිදු ජලය සැපයීම.

**උපාය මාර්ග**

a) ජල මුලාශ්‍ර සංරක්ෂණය කිරීමෙන් ලැබෙන ජලය අරපිරිමැස්මෙන් භාවිත කිරීම.
b) ජල දූෂණය අවම කිරීම.

**ප්‍රතිපත්ති අරමුණු - 3**

සශ්‍රික අස්වැන්නක් සඳහා පස ස්වභාවිකව පෝෂණය කිරීම.

**උපාය මාර්ග**

a) තෙත්බිම් එලෙසම රැකගැනීම සහ ගොඩ කිරීමෙන් වළකින්න.
b) පසේ සශ්‍රිකත්වය වැඩිදියුණු කිරීම සඳහා ස්වභාවික ක්‍රම භාවිතය සහ අපද්‍රව්‍ය නිසිලෙස කළමනාකරණය කිරීම.
c) අවට පරිසරයේ ස්වභාවික අලංකරණය එලෙසම පවත්වා ගැනීම.

## ප්‍රතිපත්ති අරමුණු - 4

පරිසර පද්ධතිය, ජෛව විවිධත්වය හා සත්ව විශේෂ ආරක්ෂා කිරීම.

### උපාය මාර්ග

a) මිනිසා හා සතුන් අතර ගැටුම් අවම කිරීමට උපාය මාර්ග සැකසීම.

b) සතුන් හා ශාඛ ජීවත් වන ස්වභාවික පරිසර පද්ධතිය විනාශ නොකර භෞමිකව ඔවුන්ගේ පැවැත්ම සඳහා ඇති ජන්ම භූමි ආරක්ෂා කිරීමට ඉඩ සැලසීම.

## අරමුණ - 5

පරිසර හිතකාමී වැඩසටහන් සංවිධානය කිරීම.

### උපාය මාර්ග

a) පරිසර දිනය සැමරීම වෙනුවෙන් සෑම දේවස්ථානයකම ස්තූති ප්‍රශංසා පූජාවක් පැවැත්වීම.

b) පරිසරය පිළිබඳ අධ්‍යාපන වැඩසටහන් සබත් පාසැල් වල හා පාසැල් වල ක්‍රියාත්මක කිරීම.

c) දේවස්ථාන, පූජක නිල නිවාස, පාසැල් හා අනෙකුත් ස්ථාන වල පරිසර පද්ධති රැකබලා ගැනීම.

d) දේවස්ථානයේ කිතුනු සභිකයන්ට ශිල්ප සහ වගා කිරීම පිළිබඳ වැඩසටහන් ප්‍රායෝගිකව පැවැත්වීම.



- පසෙහි ස්ථාවර බව පවත්වාගෙන යාම.
- සශ්‍රික පස කෘෂිකර්මාන්තයට යෙදවීම.
- ගංවතුරෙන් ආරක්ෂා වීම සඳහා වර්ෂා ජලය අවශෝෂණය කරන තෙත් බිම් සංරක්ෂණය කරන්න.

### මූල පිරිම

1. පසෙහි අස්ථාවර තත්වය වැළැක්වීම සඳහා සුදුසු ගස් වවන්න.
2. බෑවුම් සහිත ස්ථාන වල පාංශු ඛාදනය වැළැක්වීම සඳහා සුදුසු කාණු පද්ධති ලියදි සහ තෘණ වර්ග වවන්න.
3. ගංවතුර ගැලීම වැළැක්වීමට තෙත් බිම් පිරවීම ඒවාහි වගා කටයුතු කිරීම් හෝ ඉදිකිරීම් නොකරන්න.

### උපාය මාර්ග - 3 b

- පස සාරවත් කිරීම, වැඩිදියුණු කිරීම සඳහා පොහොර, ස්වභාවික කසළ වලින් කොම්පෝස්ට් නිෂ්පාදනය දියුණු කරන්න. ස්වභාවික ක්‍රමවේදයන් තුළින් අපද්‍රව්‍ය නිසිලෙස කළමනාකරණය කරන්නි

### අභියෝග

- යහපත් කෘෂිකාර්මික පිළිවෙත් හා යහපත් බිම් සැකසීමේ කළමනාකරණයකට පෙළඹීම.
- පස පෝෂණය කරන පැළෑටි සිටුවීම.
- ස්වභාවිකව දිරාපත් වන ද්‍රව්‍ය භාවිතයෙන් පසේ පෝෂණය වැඩිදියුණු කරන්න.
- දිරාපත් නොවන ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය හා ඝන අපද්‍රව්‍ය නිසිලෙස කළමනාකරණය කිරීම.

### මූලපිරිම

1. රනිල කුලයේ ශාක එනම් ලෙගුයිම්නෝසි කුලයේ ශාඛ පස සාරවත් කිරීම සඳහා භාවිතය.
2. කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා නිවසින් බැහැර කරන දිරන අපද්‍රව්‍ය හා පත්‍ර යොදාගැනීම.

**මුල පිරීම**

1. ජල පෝෂක ප්‍රදේශ වල ජලය සිඳියාම වැළැක්වීමට නිරතුරුව ගස් වැවීම.
2. ගංගාවන් ඇළ දොළ දෙපස ගස් වැවීම.
3. ජල භාවිතය අඩු කිරීම සඳහා නෑම, රෙදි සේදීම, කාර් සේදීම, වතුර දැමීම යනාදි දෑ ප්‍රවේසමෙන් භාවිතා කිරීම.
4. කැඩුණු ජල කරාම හා ජල ටැංකි පිළිසකර කර භාවිතා කිරීම.
5. නිවස තුළ අප ජලය නැවත භාවිතය

**අරමුණ 2 b**

ජල දූෂණය අවම කිරීම සඳහා දැනුවත් වීම / කිරීම

**අභියෝග**

- අපතේ යන ජලය නිසි පරිදි භාවිතය සහ ද්‍රවමය අපද්‍රව්‍ය නිසිලෙස කළමනාකරණය.
- රසායනික ද්‍රව්‍ය හා කසළ, ජල පද්ධති වලට බැහැර කිරීම නතර කිරීම

**මුල පිරීම**

1. ඉවතලන වතුර පිරිසිදු ජලයට එකතු නොකර කාණුවකට හෝ සැකසු වලකට මුදා හැරීම.
2. රසායනික අපද්‍රව්‍ය හා කසළ ජල මාර්ග වලට ගලායෑම වැළැක්වීම් (ඇළ හා ගංගා වලට)
3. ප්ලාස්ටික් බෝතල් ගංගා, වැව්, මුහුදු වලට විසි නොකර ප්‍රතිචක්‍රීකරණය කරන්න.

**අරමුණු - 3**

උපරිම අස්වැන්නක් ලබාගැනීම සඳහා මහ පොළව පෝෂණය කරන්න.

**උපාය මාර්ග 3 a**

නිසි ලෙස බිම් සැකසීම කළමනාකරණය කර, ජලවහනය දියුණු කිරීම. (පස හා තෙත් බිම් වල) කෘෂිකාර්මික භූමි ආරක්ෂා කිරීම සහ ස්වභාවික ක්‍රම මගින් පෝෂණය කිරීම.

**අභියෝග**

- පාංශු ඛාදනය වැළැක්වීම.



# කාණ්ඩය B

## දියෝකිස් පරිසර ප්‍රතිපත්තිය,

අරමුණු, උපායමාර්ග, අභියෝග හා මුල පිරීම.

**පරිසර අරමුණු 1**

ජනතාවගේ නිරෝගි පැවැත්ම සඳහා වාතයේ පිරිසිදුකම රැකගැනීම.

**උපාය මාර්ග 1 a**

වාතයේ පිරිසිදුකම රැකගැනීමට ගස් වැවීම.

**අභියෝග**

- පළාතට සුදුසු අවේණික ගස් සිටුවීම.
- වන විනාශය අවම කිරීම.
- ගස් වල නිරෝගි පැවැත්ම ආරක්‍ෂා කිරීම.
- ස්වභාවික පරිසරයේ ඇති පැළෑටි හා ගස්වල පැවැත්ම හා පෝෂණය ආරක්ෂා කිරීම.

**මුල පිරීම**

1. විශාලව වැඩුනු ගස් ආරක්ෂා කිරීම හා රැක බලාගැනීම්
2. ශාක වර්ගීකරණය අනුව පැළෑටි සහ ගස් වැවීම. (කඳුකර බෑවුම් හා තැනිතලා බිම්) හා දේශගුණ කලාප වලට ගැලපෙන සුදුසු පැළෑටි සහ ගස් වැවීම (තෙත් කලාපය, වියලි කලාපය හා වෙනත්)
3. නියමිත වර්ෂා කාලවලදී වැඩුනු ගස් කප්පාදු කිරීම හා නියමිත වේලාවට කාබනික පොහොර යෙදීමෙන් ගස් නිරෝගීව පවත්වා ගැනීම්
4. ගස් කපා ඉවත් කිරීමට පෙර එම ස්ථානයේ නැවත ගසක් සිටුවා අඩි 5 ක් උස් වූ පසු පැරණි ගස ඉවත් කිරීම සුදුසුය.
5. දියෝකීසි අධිකාරිත්වයට අයත් භූමි වල විශාල ගස් කැපීමට පෙර පරිසර කමිටුව උපදේශය හා අවසරය ලබාගත යුතුය. දියෝකීසි භූමි විකිණීමට පෙර ස්ථාවර කාරක සභාවේ අවසරය ලබාගත යුතුයි.

**උපාය මාර්ග 1 b**

පරිසරයට මුදාහරින දූෂණය වූ වායු පාලනය කිරීම සහ සූර්ය බලශක්තිය විදුලිය නිපදවීම සඳහා යොදා ගැනීම.



**අභියෝග**

- විෂ වායුගෝලයට මුදා හැරීම පාලනය කිරීම සහ අපද්‍රව්‍ය පිළිස්සීම තුළින් වායුගෝලයට මුදා හැරෙන විෂ සහිත වායු අවම කිරීම.
- කාබන්ඩයොක්සයිඩ් නිෂ්පාදනය අවම කිරීම.
- ගල් අඟුරු භාවිතය පරිසරයට හානිකරය. (විදුලි බල උත්පාදනයේ දී) සූර්ය බලශක්තිය පරිසර හිතකාමී වේ.

**මුලපිරීම**

1. රසායනික දියර ඉසීමෙන් වැළකීම.
2. වනාන්තර ගිනිතැබීම් සහ කසළ පිලිස්සීම් තුළින් දුමාරය නතර කිරීම්
3. වාහන දුම, පරිසරයට මුදාහැරීම අඩුකිරීම සඳහා ඇවිදීම, පාපැදිය භාවිතය හා ළඟ ඇති සභාවේ කෙනෙකුගේ සහයෝගයෙන් එකම වාහනයෙන් දේවස්ථානයට පැමිණීම.
4. දේවස්ථාන, පූජක නිල නිවාස, පාසැල් හා අනෙකුත් ආයතන, හැකි පමණ සූර්ය බල ශක්තිය මගින් විදුලිය උත්පාදනය කිරීමට සැලැස්වීම.

**අරමුණු - 2**

පිරිසිදු ජලය නිරන්තරුවම නොඅඩුව සැපයීම.

**උපාය මාර්ග - 2 a**

ජල මූලාශ්‍ර සංරක්‍ෂණය කිරීමෙන් ලැබෙන ජලය, පිරිමැස්මෙන් භාවිතා කිරීම.

**අභියෝග**

- ජල පෝෂක ප්‍රදේශ හා ජල මූලාශ්‍ර හඳුනාගැනීම උල්පත් ඇළදොළ සහ ළිං. (දිය ඇලි)
- අවම ජල භාවිතය.
- සෑම ජල බිංදුවක්ම වටිනා බව සිතා ජලය නාස්ති කිරීමෙන් වැළකීම.